සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

40762

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- 02 වන ප්‍රශ්නයේ සිට 07 වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලින් ඔබ කැමති ප්‍රශ්න 04ක් ද තෝරා ගෙන සම්පූර්ණ ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.

---

(01) (i) ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් රෝග වැළඳෙන ක්‍රම අතෙන් දෙකක් ලියා දක්වන්න.

(ii) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය වර්ණනාවට ලක්කළ අවස්ථා දෙකක් නම් කරන්න.

(iii) සිදුහත් කුමරු සර්වමිත්‍ර බමුණාගෙන් ශිල්ප හැදෑරීමේ දී උගත් ශිල්ප දෙකක් නම් කරන්න.

(iv) පංච නීවරණ ධර්මවලින් හතරක් නම් කරන්න.

(v) දුටුගැමුණු රජතුමා විසින් කරවා බුද්ධ ශාසනයට පූජා කළ බෞද්ධ ස්තූප දෙකක් නම් කරන්න.

(vi) අනගාරික ධර්මපාලතුමාගේ මුල් ම නම සහ පැවිදි නම ලියා දක්වන්න.

(vii) බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

(viii) සිදුහත් කුමරුගේ ළමා කාලයේ දක්නට ලැබුණු යහපත් ගුණාංග දෙකක් ලියා දක්වන්න.

(ix) බුදුරජාණන් වහන්සේගේ "පුරිසදම්මසාරථී ගුණය" ප්‍රකටවන නිදසුන් දෙකක් ලියා දක්වන්න.

(x) පාරමිතාවක් බෙදෙන ප්‍රධාන කොටස් තුනකි. ඉන් දෙකක් නම් කරන්න.

(ලකුණු 2×10 = 20)

(02) (i) "තංච කම්මං කතං සාධු....." යන ධම්මපද ගාථාවේ ඉතිරි පාඨ සම්පූර්ණ කර ලියා දක්වන්න.

(ii) ඉහත ගාථාවේ සරල අර්ථය ලියා දක්වන්න.

(iii) අප තුළ සතුට ඇති කරන යහපත් ක්‍රියාවන් කිරීම පුද්ගල දියුණුවට හේතුවන අයුරු විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

(03) (i) "භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා" මෙම පාලි පාඨයේ අර්ථයට අනුව භාවනාව යන්න සරලව හඳුන්වන්න.

(ii) සමථ භාවනාව වැඩීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකු භාවනා ගුරුවරයෙකු වෙත එළඹ තම චරිතයට අනුව භාවනා උපදෙස් ලබා ගත යුතු ය. එවැනි පුද්ගල චරිත හයකි. ඉන් තුනක් නම් කරන්න.

(iii) සමථ භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ආදර්ශයන් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

(04) (i) බෞද්ධ ඉගැන්වීම්වල සඳහන් වන කර්මයේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

(ii) විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද තුනක් නම් කරන්න.

(iii) කර්මය සහ එහි විපාක මැනවින් අවබෝධ කරගෙන ජීවත්වීම සසර සැප විඳීමට හේතුවන අයුරු විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

(05) සම්බුද්ධ ශාසනයේ සුරක්ෂිතතාව හා අභිවෘද්ධිය වෙනුවෙන් මහතෙරවරුන් එක්ව බුද්ධ වචනය ඒකරාශී කොට සජ්ඣායනා කිරීම ධර්ම සංගායනා නම් වේ.

(i) පළමු ධර්ම සංගායනාවේ මූලිකත්වය ගත් මහ රහතන් වහන්සේ හා එම සංගායනාව පැවැත්වූ ස්ථානය නම් කරන්න.

(ii) පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵල තුනක් ලියා දක්වන්න.

(iii) විවිධ දුර්මත දැරූ පුද්ගලයන්ගෙන් නිර්මල බුද්ධ වචනය ආරක්ෂා කර ගැනීමට පළමු ධර්ම සංගායනාව හේතු වූ අයුරු සාකච්ඡා කරන්න.

(ලකුණු 2+3+5 = 10)

(06) (i) ස්වාභාවික පරිසරය හා බැඳුණු බුදු සිරිතේ වැදගත් සිදුවීම් දෙකක් නම් කරන්න.

(ii) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරයේ වස් විසූ ස්ථාන තුනක් නම් කරන්න.

(iii) පරිසරය රැක ගැනීම අප සියලු දෙනාගේ ම වගකීමකි. එහිදී ඔබට කළ හැකි කාර්යභාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) පේරුකානේ චන්දවිමල හිමිපාණන් වහන්සේ

(ii) සදකඩපහණ

(iii) චතුරාර්ය සත්‍යය

(iv) සතර සංග්‍රහ වස්තු

(ලකුණු 5+5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

40760

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) බුදුරජාණන් වහන්සේ පළමු වස් කාලය ගත කළ ස්ථානයේ නම වනුයේ,

(1) රජගහනුවර වේළුවනාරාමය ය. (2) බරණැස ඉසිපතන ය.
(3) බුද්ධගයාව ය. (4) බේලුව ගම ය.

(02) මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු ධර්මදූත පිරිස ලංකාවට බුදු දහම රැගෙන වැඩම කළේ ක්‍රි.පූ.

(1) පළමු සියවසේදී ය. (2) දෙවන සියවසේදී ය.
(3) තුන්වන සියවසේදී ය. (4) හතරවන සියවසේදී ය.

(03) දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා බුදුරජාණන් වහන්සේ විසින් වජ්ජි රාජ්‍ය පාලකයන් සඳහා දේශනා කරනු ලැබූ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති මාලාව හඳුන්වනු ලබන්නේ,

(1) සතර සංග්‍රහ වස්තු නමින් ය. (2) සිව්බඹ විහරණ නමින් ය.
(3) සප්ත අපරිහානීය ධර්ම නමින් ය. (4) දසරාජ ධර්ම නමින් ය.

(04) බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ වර්ණනා කරමින් විද්‍යාචක්‍රවර්තින් විසින් බුත්සරණ කෘතිය රචනා කරනු ලැබූ යුගය වන්නේ,

(1) අනුරාධපුර යුගයයි. (2) පොළොන්නරු යුගයයි.
(3) ගම්පොළ යුගයයි. (4) කුරුණෑගල යුගයයි.

(05) බුරුම භාෂාවත්, ත්‍රිපිටකයත්, භාවනාවත් හොඳින් පුරුදු පුහුණු කර බුරුමයේ දී උපසම්පදාව ලැබූ භික්ෂුව,

(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය. (2) රේරුකානේ චන්ද්‍රවිමල හිමියන් ය.
(3) වැලිවිට සරණංකර හිමියන් ය. (4) සිරි දේවමිත්ත ධර්මපාල හිමියන් ය.

(06) "හේතු ප්‍රත්‍ය ඇති කල ඇති වන්නා වූ ධර්මයෝ හේතු ප්‍රත්‍ය නැති කල නැති වෙත් යන මෙකී දහම බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබේ" යැයි අස්සජි තෙරුන් ප්‍රකාශ කළේ,

(1) පිප්ඵලී තරුණයාට ය. (2) අජාසත්ත කුමාරයාට ය.
(3) කෝලිත තරුණයාට ය. (4) උපතිස්ස තරුණයාට ය.

(07) මෙලොව පුද්ගල විසමතා දාහතරක් පිළිබඳව සඳහන් කරමින් බුදුරජාණන් වහන්සේ සුභ මානවකයාට දේශනා කළ සූත්‍රය වන්නේ,

(1) චූල්ලකම්මවිභංග සූත්‍රයයි. (2) කාලාම සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.

(08) ලංකාවට පැමිණි හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා බුදුදහම වැළඳ ගත්තේ,
(1) මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේදී ය.
(2) ගාල්ල විජයානන්ද විහාරස්ථානයේදී ය.
(3) මහනුවර දළදා මාලිගාවේදී ය.
(4) පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේදී ය.

(09) "සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා" යි ප්‍රාර්ථනා කළ භික්ෂුව වන්නේ,
(1) වැලිවිට සරණංකර හිමියන් ය.
(2) මේරුකානේ චන්ද්‍රවිමල හිමියන් ය.
(3) සිරිදේවමිත්ත ධර්මපාල හිමියන් ය.
(4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ය.

(10) පංචස්කන්ධ විග්‍රහයට අනුව හඳුනාගෙන රැස්කරන දේ යනුවෙන් අර්ථ ගැන්වෙන ස්කන්ධය,
(1) වේදනා නම් වේ.
(2) සඤ්ඤා නම් වේ.
(3) සංඛාර නම් වේ.
(4) විඤ්ඤාණ නම් වේ.

(11) සිව්වන ථේරවාද ධර්ම සංගායනාව මාතලේ අළුවිහාරයේ දී පැවැත් වූයේ ක්‍රි.පූ.
(1) පළමු සියවසේදී ය.
(2) දෙවන සියවසේදී ය.
(3) තෙවන සියවසේදී ය.
(4) පස්වන සියවසේදී ය.

(12) බුදුරජාණන් වහන්සේ අනාථපිණ්ඩික සිටුතුමාට දේශනා කළ පත්තකම්ම සූත්‍රයේ "පත්තකම්ම" යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ,
(1) සුදුසු ක්‍රියාව හෙවත් කළ යුත්තයි.
(2) නුසුදුසු ක්‍රියාව හෙවත් නොකළ යුත්තයි.
(3) ධනය නුවණින් යුතුව පරිභෝග කිරීමයි.
(4) ධනය අස්ථාන ගතවීම වළක්වා ගැනීමයි.

(13) ථේරවාද බුදු දහම අපේ රටට හඳුන්වා දීමේ දී පුරෝගාමී මෙහෙවරක් ඉටුකළ මහරහතන් වහන්සේ වූයේ,
(1) මිහිඳු මහරහතන් වහන්සේ ය.
(2) ඉට්ඨිය මහරහතන් වහන්සේ ය.
(3) උත්ථිය මහරහතන් වහන්සේ ය.
(4) මොග්ගලිපුත්ත තිස්ස මහ මහරහතන් වහන්සේ ය.

(14) රටේ ජනතාව ආර්ථික හා සමාජයීය වශයෙන් විවිධ ගැටලු හා අභියෝගවලට මුහුණ දෙනවිට පාලකයා, ඒවාට කාරුණික හැඟීමෙන් විසඳුම් ලබා දීම දසරාජ ධර්මයන්ට අනුව,
(1) ඍජු නම් වේ.
(2) මෘදු නම් වේ.
(3) අක්‍රෝධය නම් වේ.
(4) අවිරෝධතා නම් වේ.

(15) සමාධි ගත කළ සිත තුළින් ලොව යථා ස්වභාවය දැකීමට උපකාර වන භාවනාව වන්නේ,
(1) ආනාපානසති භාවනාවයි.
(2) ප්‍රඥා භාවනාවයි.
(3) සමථ භාවනාවයි.
(4) මෛත්‍රී භාවනාවයි.

(16) බුදුරජාණන් වහන්සේ විසින් අනේපිඬු සිටුතුමාට දේශනා කළ පත්තකම්ම සූත්‍රයට අනුව මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීමේ අර්ථය,
(1) ඥාති බලි නම් වේ.
(2) අථිති බලි නම් වේ.
(3) පුබ්බපේත බලි නම් වේ.
(4) දේවතා බලි නම් වේ.

(17) කෝට්ටේ යුගයේ විසූ වීදාගම මහා මෛත්‍රේය හිමියන් විසින් රචිත නූතනයේ "කව්බණ පොත" නමින් හැඳින්වෙන ග්‍රන්ථය වන්නේ,
(1) දහම් ගැට මාලයයි.
(2) ලෝකෝපකාරයයි.
(3) බුදුගුණාලංකාරයයි.
(4) ලෝවැඩ සඟරාවයි.

(18) නූතන යුගයේ සිතුවම් කලාවේ පුරෝගාමී ශිල්පියෙකු වූ එම්. සාර්ලිස් මහතා විසින් අඳින ලද සිතුවම් දක්නට ලැබෙන විහාරස්ථානයක් වන්නේ,

(1) කුරුණෑගල රිදී විහාරයයි.
(2) කැලණියේ අලුත් විහාරයයි.
(3) කොළඹ මාළිගාකන්ද විහාරයයි.
(4) බොරැල්ල ගෝතමී විහාරයයි.

(19) සඟමිත් තෙරණිය විසින් ලංකාවට වැඩම කරවන ලද ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කළ ස්ථානය වනුයේ,

(1) මහමෙවුනා උද්‍යානයේ ය.
(2) තිවක්ක බමුණු ගමේ ය.
(3) මහානාග උද්‍යානයේ ය.
(4) දඹකොළ පටුනේ ය.

(20). බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු හයවන සතියේ වැඩසිටි ස්ථානය වනුයේ,

(1) මුචලින්ද විල අසල ය.
(2) අජපාල නුගරුක මුල ය.
(3) රුවන් සක්මනෙහි ය.
(4) රාජායතන කිරිපලු රුක් මුල ය.

(21) බුදුදහමේ සඳහන් චතුර්විධ සුඛයන් (සැපයන්) අතර තිදොර සංවරව කටයුතු කිරීමෙන් ලබන සැපය නම්,

(1) අත්ථි සුඛයයි.
(2) භෝග සුඛයයි.
(3) අනණ සුඛයයි.
(4) අනවජ්ජ සුඛයයි.

(22) තෙවන ධර්මසංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරටට වැඩම කළ තෙරුන් වහන්සේලා පළමුවෙන් ම දේශනාකළ සූත්‍ර දේශනාවන් අතර චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කළේ,

(1) මහාදේව මහරහතන් වහන්සේ ය.
(2) මිහිඳු මහරහතන් වහන්සේ ය.
(3) රක්ඛිත මහරහතන් වහන්සේ ය.
(4) මජ්ඣිම මහරහතන් වහන්සේ ය.

(23) සසර දුකට හේතුවන විවිධ කෙලෙස් ධර්මයන් අතර මූලික වන තණ්හාව කාම, භව, විභව යනුවෙන් ත්‍රිවිධාකාර වශයෙන් දේශනා කළ පළමු සූත්‍රය වනුයේ,

(1) දම්සක්පැවැතුම් සූත්‍රයයි.
(2) මහා මංගල සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි.
(4) කරණීය මෙත්ත සූත්‍රයයි.

(24) අනුරාධපුර යුගයට අයත් පැරණි ම සිංහල පද්‍ය නිර්මාණ දැනට හමු වී ඇති ස්ථානය නම්,

(1) බදුලු ටැම් ලිපියයි.
(2) මිහින්තලා සෙල් ලිපියයි.
(3) ගල්පොත සෙල් ලිපියයි.
(4) සීගිරි කැටපත් පවුරයි.

(25) ථේරවාද සංගායනා අතර පැළලුප් නුවර අශෝකාරාමයේ දී පවත්වන ලද සංගායනාව වනුයේ,

(1) පළමු ධර්ම සංගායනාවයි.
(2) දෙවන ධර්ම සංගායනාවයි.
(3) තෙවන ධර්ම සංගායනාවයි.
(4) කණිෂ්ක ධර්ම සංගායනාවයි.

(26) බරණැස ඉසිපතන මිගදායේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ චතුරාර්ය සත්‍ය දේශනාව පළමුවෙන් ම ශ්‍රවනය කළ පිරිස වනුයේ,

(1) භද්දවග්ගිය කුමාරවරුන් ය.
(2) තුන් බෑ ජටිල පිරිස ය.
(3) පස්වග තවුසන් ය.
(4) ශාක්‍ය වංශිකයන් ය.

(27) දුක්ඛ නිරෝධ ගාමිනීපටිපදාර්ය සත්‍යයෙහි ඇතුළත් මාර්ගාංග ගණන,

(1) හතරකි.
(2) අටකි.
(3) දහයකි.
(4) දොළහකි.

(28) පස්කම් සැපතින් නික්මීම ද, අනුන් නො නැසීම ද, අනුන්ට හිංසා නො කිරීම ද වශයෙන් කල්පනාව ඇතිකර ගැනීම,

(1) සම්මා දිට්ඨි නම් වේ.
(2) සම්මා සංකප්ප නම් වේ.
(3) සම්මා කම්මන්ත නම් වේ.
(4) සම්මා ආජීව නම් වේ.

(29) බුදුවන බෝසතුන්ට සෙවණ දුන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ඉතිහාසය පිළිබඳව විස්තරවන සිංහල බෝධිවංශය නම් කෘතිය රචනා වූයේ,

(1) යාපහුව යුගයේ දී ය.
(2) ගම්පොළ යුගයේ දී ය.
(3) කුරුණෑගල යුගයේ දී ය.
(4) මහනුවර යුගයේ දී ය.

(30) කැලණිය විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීමට පුරෝගාමී මෙහෙවරක් ඉටුකළේ,
(1) රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමියන් ය.
(2) රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් ය.
(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය.
(4) වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන් ය.

(31) තම පියා ඝාතනය කිරීමෙන් පසු මානසික පීඩනයට පත්ව සිටි අජාසත් රජතුමා බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණි ස්ථානය වූයේ,
(1) ජීවක අඹ වනය ය.
(2) අම්බපාලි අඹ වනය ය.
(3) ශාක්‍යයන්ගේ නිග්‍රෝධ උයන ය.
(4) රජගහනුවර වේළුවනාරාමය ය.

(32) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස භාරතයේ සහ ඉන් බාහිරව රටවල් නවයකට බුදු දහම ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රධානත්වය ගෙන කටයුතු කළේ,
(1) කණිෂ්ක රජතුමා ය.
(2) අජාසත්ත රජතුමා ය.
(3) කාලාශෝක රජතුමා ය.
(4) ධර්මාශෝක රජතුමා ය.

(33) වේරංජා නුවර වස් විසූ බුදුරජාණන් වහන්සේ වස් තුන් මස තුළ සිව්පසය නිසි පරිදි නොලැබීම හේතුවෙන් කිසිවිටෙකත් කම්පා නොවූයේ උන්වහන්සේ තුළ තිබූ,
(1) තාදී ගුණය නිසා ය.
(2) අරහං ගුණය නිසා ය.
(3) පුරිසදම්මසාරථී ගුණය නිසා ය.
(4) භගවා ගුණය නිසා ය.

(34) අනුරාධපුර තොළුවිල ප්‍රදේශයෙන් හමු වූ සමාධි බුද්ධ ප්‍රතිමාව වර්තමානයේ තැන්පත් කර ඇති ස්ථානය වනුයේ,
(1) අනුරාධපුර මහමෙව්නා උයනයි.
(2) කොළඹ කෞතුකාගාරයයි.
(3) අනුරාධපුර කෞතුකාගාරයයි.
(4) මහනුවර දළදා මාලිගාවයි.

(35) තම ශරීර අවයව විනාශ වුව ද තමා සමාදන් වූ සීලය කඩ නො කොට ආරක්ෂා කිරීම හඳුන්වන පාරමිතා ප්‍රභේදය වන්නේ,
(1) සීල පාරමිතාවයි.
(2) සීල උපපාරමිතාවයි.
(3) සීල පරමත්ථ පාරමිතාවයි.
(4) වීර්ය පාරමිතාවයි.

(36) පුබ්බාචරිය, පුබ්බදේව, බ්‍රහ්ම යන විශේෂ පදවලින් බුදු දහමේ හඳුන්වා ඇති පුද්ගලයා වනුයේ,
(1) බුදුරජාණන් වහන්සේ ය.
(2) දෙමාපියන් ය.
(3) රටේ පාලකයා ය.
(4) ගුරුවරුන් ය.

(37) වාඩිවී සිටින විට දකුණු පාදය වම්පාදයට උඩින් පිහිටන සේ නිර්මාණය කර ඇති බුද්ධ ප්‍රතිමාවකින් ප්‍රකටවන ආසනය හඳුන්වන්නේ,
(1) පද්මාසනය නමින් ය.
(2) භද්‍රාසනය නමින් ය.
(3) වීරාසනය නමින් ය.
(4) වජ්‍රාසනය නමින් ය.

(38) පොළොන්නරු යුගයේ විශාලත ම චිත්‍රාවලිය දක්නට ලැබෙන ජේතවනාරාමයේ තිවංක පිළිමගෙය කරවන ලද්දේ,
(1) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි.
(2) මහා විජයබාහු රජතුමා විසිනි.
(3) නිශ්ශංකමල්ල රජතුමා විසිනි.
(4) සීගිරි කාශ්‍යප රජතුමා විසිනි.

(39) බුදුරජාණන් වහන්සේ මිනිසුන්ට පමණක් නොව තිරිසන් සතුන්ට ද එක සේ ම කාරුණික වූහ. එයට කදිම නිදසුනක් වන්නේ,
(1) භද්‍රවතිකා ඇතින්නට පිහිටවීමයි.
(2) නාලාගිරි ඇතු දමනය කිරීමයි.
(3) නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීමයි.
(4) කන්ථක අශ්වයා දෙව්ලොව ඉපදීමයි.

(40) බෞද්ධ සාහිත්‍යට අනුව මහාකාශ්‍යප මහරහතන් වහන්සේ අසනීප වූ විට බුදුරජාණන් වහන්සේ වැඩම කර පිරිත් දේශනා කළ ස්ථානය වූයේ,
(1) චාලිය පර්වතයයි.
(2) සූකරකත ලෙනයි.
(3) කලන්දක නිවාපයයි.
(4) පිප්ඵලී ගුහාවයි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් අධ්‍යාපන
மேல் மாகாணக் கல்வித் திணைக்களம் மேல் மாகாணக்
Western Province Education Department Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 11
විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය
පත්‍රය / வினாத்தாள் / **Paper**: **I, II**

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 1 | (21) | 4 | (31) | 1 |
| (02) | 3 | (12) | 3 | (22) | 2 | (32) | 4 |
| (03) | 3 | (13) | 1 | (23) | 1 | (33) | 1 |
| (04) | 2 | (14) | 2 | (24) | 4 | (34) | 2 |
| (05) | 2 | (15) | 2 | (25) | 3 | (35) | 3 |
| (06) | 4 | (16) | 3 | (26) | 3 | (36) | 2 |
| (07) | 1 | (17) | 4 | (27) | 2 | (37) | 3 |
| (08) | 2 | (18) | 3 | (28) | 2 | (38) | 1 |
| (09) | 3 | (19) | 1 | (29) | 3 | (39) | 1 |
| (10) | 3 | (20) | 1 | (30) | 2 | (40) | 4 |

## II පත්‍රය

(01) (i) 10 ශ්‍රේණිය පෙළපොත 94 හා 95 පිටු.

(ii) 10 ශ්‍රේණිය පෙළපොත 92 පිටුව.

(iii) නීති ශාස්ත්‍රය, කඩු ශිල්පය, දුනු ශිල්ප, ඇතුන් හැසිරවීම, අශ්වයන් හැසිරවීම ආදිය.
(10 ශ්‍රේණිය පෙළපොත 01 පිටුව)

(iv) කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා.

(v) රුවන්වැලි මහා සෑය / මිරිසවැටි දාගැබ

(vi) දොන් ඩේවිඩ් හේවාවිතාරණ සහ සිරි දේවමිත්ත ධර්මපාල හිමි.

(vii) සමථ / සමාධි / චිත්ත භාවනාව සහ විදර්ශනා / විපස්සනා / ප්‍රඥා / ත්‍රිලක්ෂණ භාවනාව.

(viii) කීකරු බව, කාරුණික බව, උගන්වන දේ හොඳින් ධාරණය කර ගැනීම, මෙත් සිතුවිලිවලින් යුක්ත වීම, නිර්භීත බව, අන් අය තලා පෙළා නැගී නො සිටීම, වයසට ගැළපෙන දේ පමණක් කිරීම, දෙමාපියන්ට අගෞරවයක් වන දේ නො කිරීම, ධනය බලය හා රාජ බලයෙන් උදම් නොවීම, විමසුම් නුවණින් කටයුතු කිරීම. (10 ශ්‍රේණිය පෙළපොත 02 පිටුව)

(ix) 11 ශ්‍රේණිය පෙළපොත 11 හා 12 පිටු. එම ගුණයට අදාළ ව ඕනෑ ම නිදසුන් දෙකක්.

(x) පාරමිතා, උප පාරමිතා, පරමත්ථ පාරමිතාව.

(02) (i) තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො - විපාකං පටිසෙවති

(ii) යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු නොවේ ද යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේ ද එබඳු ක්‍රියාවන්හි නිරත විය යුතු ය.

(iii) ප්‍රශ්නයට අදාළ ව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(03) (i) සිතේ කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

(ii) රාග චරිත, දෝස චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත, විතර්ක චරිත.
(11 ශ්‍රේණිය 4 පාඩම 37 පිටුව)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(04) (i) කුසල කර්ම සහ අකුසල කර්ම.

(ii) දිට්ඨධම්මවේදනීය කර්ම, උපපජ්ජවේදනීය කර්ම, අපරාපරියවේදනීය කර්ම, අහෝසි කර්ම.

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(05) (i) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ, මගධයේ රජගහ නුවර වේභාර කඳු පාමුල සප්තපර්ණි ගල් ගුහාවේදී ය.

(ii) විසිරී තිබුණු ධර්ම විනය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම, ධර්ම විනය කොටස් කර භාණක පරපුරකට පැවැරීම, නව විනය නීති නොපැන වීමට ත් පැන වූ විනය නීති ආරක්ෂා කිරීමට ත් ප්‍රතිඥා දීම.

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(06) (i) පිළිගත හැකි ඕනෑ ම සිදුවීම් දෙකක් ලියා ඇත්නම් ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(ii) 10 ශ්‍රේණිය පෙළ පොත 90 පිටුව. එහි සඳහන් ඕනෑ ම නිදසුන් දෙකක්.

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(07) මාතෘකා දෙකකට අදාළව ලියා ඇති පිළිතුරු වලට අනුව ප්‍රමාණවත් ලකුණු පි රිනමන්න.